ET/SSS/2022(2023)/OL/62/S/Q/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Civic Education

# පුරවැසි අධ්‍යාපනය



Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)

Nenasa
The National e-learning Portal for The General Education

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 62 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series -**

පුරවැසි අධ්‍යාපනය I, II
**குடிமை கல்வி I, II**
**Civic Education I, II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**පුරවැසි අධ්‍යාපනය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පාලන ආයතනය වූයේ පහත ඒවායින් කුමක් ද?

   (1) ගම් සභාව (2) නගර සභාව
   (3) ප්‍රාදේශීය සභාව (4) පුරවැසි සභාව

2. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රම නූතනයේ ක්‍රියාත්මක කිරීමේ දී මතුවන ගැටලුවක් වන්නේ,

   (1) පුරවැසියන්ගේ ආදායම්වල විෂමතාවක් පැවතීම ය.
   (2) නිශ්චිත කාලයට මැතිවරණ පැවැත්වීම ය.
   (3) නූතන රාජ්‍ය විශාලත්වයෙන් අධික වීම ය.
   (4) රාජ්‍යය තුළ ජනගහනය සීමිත ප්‍රමාණයක් සිටීම ය.

3. රාජ්‍යයක් තම පාලන කටයුතු පවත්වා ගෙන යෑමේ දී ඉටු කළ යුතු වගකීමක් වන්නේ,

   (1) සමාජ සුරක්ෂිතතාව හා පෞද්ගලික සුඛසාධනය ඇති කිරීම ය.
   (2) රටේ සම්පත් අසාධාරණව බෙදී නොයන පරිදි කටයුතු කිරීම ය.
   (3) සමානාත්මතා මූලධර්මය ආරක්ෂා නොකිරීම ය.
   (4) රාජ්‍ය මුදල් පාලනයේ දී විනිවිද භාවයෙන් තොරව කටයුතු කිරීම ය.

4. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ජනතාව සතු පරමාධිපත්‍ය බලයට ඇතුළත් වන කරුණු අන්තර්ගත පිළිතුර කුමක් ද ?

   (1) පාලන බලතල, මූලික නීතිය හා ජන්ද බලය වේ.
   (2) මූලික අයිතිවාසිකම්, මානව හිමිකම් සහ පාලන බලතල වේ.
   (3) පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ජන්ද බලය වේ.
   (4) මූලික නීතිය, මූලික අයිතිවාසිකම් හා පාලන බලතල වේ.

5. ලෝකයේ නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතුවක් වන්නේ මින් කුමක් ද?
(1) ප්‍රාදේශීය ආණ්ඩු ශක්තිමත් නොකළ යුතු වීම
(2) එක්සත්කම ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවක් නොතිබීම
(3) ජාත්‍යන්තර ආරක්ෂාව තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවක් පැවතීම
(4) එක් මධ්‍යස්ථානයක සිට පාලන කටයුතු සිදු කිරීමේ අපහසුව

6. “එක් මධ්‍යම බල ආයතනයක් පමණක් නීති පැනවීම පිළිබඳව උත්තරීතර බලය ඉසිලීම ඒකීය ආණ්ඩුක්‍රමයක මූලික ම ලක්ෂණය වේ.” මෙසේ පෙන්වා දුන් දේශපාලන විද්‍යාඥයා වන්නේ,
(1) හැරල්ඩ් ජේ ලැස්කි (2) ඒ. වී. ඩයිසි
(3) ජෝන් ඔස්ටින් (4) ජොහාන් ගැල්ටුන්

7. බලය විමධ්‍යගත කිරීම තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වන්නේ,
(1) ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පැවතීම ය.
(2) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම ය.
(3) බලතල ඕනෑ ම අවස්ථාවක ආපසු පවරා ගත හැකි වීම ය.
(4) සියලු ම තීරණ ප්‍රාදේශිය ආණ්ඩු විසින් ගනු ලැබීම ය.

8. රාජ්‍ය උපාය සම්බන්ධතා ශක්තිමත් කරලීමට ඉවහල් වන සාධකයක් වන්නේ,
(1) ද්වි පාර්ශ්වීය රාජ්‍ය නායක හමු වීම ය.
(2) යුධ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම ය.
(3) ඖෂධ වැනි මානුෂීය ආධාර ලබා දීම ය.
(4) හමුදා ශක්තිය ලබා දීම ය.

9. ලෝකයේ සන්ධීය ආණ්ඩු ක්‍රම පවතින රටවල් පමණක් අඩංගු පිළිතුර වන්නේ,
(1) ඇමෙරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය, ශ්‍රී ලංකාව
(2) ඇමෙරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය, බ්‍රිතාන්‍යය
(3) ඉන්දියාව, බ්‍රිතාන්‍යය, ශ්‍රී ලංකාව
(4) ස්විට්සර්ලන්තය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය

10. ශ්‍රී ලංකාවේ පළාත් සභාවක ආණ්ඩුකාරවරයා සතු බලතල හා කාර්යයන් යටතට ගැනෙන ප්‍රකාශය කුමක් ද?
(1) හදිසි අවස්ථාවල දී මහ ඇමැතිවරයාගේ උපදෙස් අනුව ක්‍රියා කිරීම
(2) මධ්‍යම ආණ්ඩුව හා ප්‍රාදේශිය සභාව අතර සම්බන්ධීකරණය සිදු කිරීම
(3) පළාත් සභාව ඇමතීම හා පළාත් ප්‍රඥප්තීන් අනුමත කිරීම
(4) මහ ඇමතිවරයා පත් කිරීම හා උපදෙස් දීම

11. ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීමට බලපෑ සංස්කෘතික සාධකයක් වන්නේ,
(1) මිහිඳු මහරහතන්වහන්සේ ඇතුළු පිරිස පැමිණීම ය.
(2) ඉන්දියන් සාගරයේ මධ්‍යගත ව පිහිටීම ය.
(3) සංචාරකයින්ට යෝග්‍ය වෙරළ තීරයක් තිබීම ය.
(4) චීනය සමඟ විවිධ ආර්ථික ගිවිසුම් අත්සන් කිරීම ය.

12. සම්පත් නිසි කළමනාකරණයකින් තොර ව භාවිත කිරීම නිසා සමාජ සාධාරණත්වය ගොඩනැගීම දුර්වල වී තිබේ. එයට බලපෑ හේතුවක් වන්නේ පහත පිළිතුරුවලින් කුමක් ද?
(1) රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමතාව
(2) රාජ්‍ය පාලකයින් වගකීමෙන් වැඩ කිරීම
(3) පෞද්ගලික අංශය ජාතික අභිලාෂ සලකා බැලීම
(4) අල්ලස් හා දූෂණ ක්‍රියා ඉහළ යෑම

13. රුසියාව, චීනය, පෝලන්තය යන රටවල් වර්තමානයේ භාවිත කරන ආරථික ක්‍රමය වන්නේ,
(1) ධනවාදී (2) පරිවර්තන
(3) මිශ්‍ර (4) සමාජවාදී

14. ශ්‍රී ලංකාවට ගෝලීයකරණය නිසා සිදු වී ඇති සෘණාත්මක බලපෑමක් වන්නේ,
(1) විදේශ ආයෝජන හා නවීන තාක්ෂණය ගලා ඒම ය.
(2) දේශිය නිෂ්පාදන සාධකවලට වැඩි ඉල්ලුමක් ඇති වීම ය.
(3) විවිධ කලාපීය සංවිධාන හා එකතු වීමට හැකි වීම ය.
(4) කර්මාන්තශාලා වලින් සිදුවන පාරිසරික හානි ඉහළ යෑම ය.

15. තිරසර සංවර්ධනයේ දී සැලකිය යුතු කරුණක් වන්නේ,
(1) අනාගත පරම්පරාව සමඟ ඒකමතික නොවීම ය.
(2) සම්පත් අධි පරිභෝජනයෙන් වැළකීම ය.
(3) ජනතා සහභාගිත්වය බැහැර කිරීම ය.
(4) ද්විතීයක අවශ්‍යතා තෘප්තිමත් කර ගැනීම ය.

16. සංවර්ධන ක්‍රියාවලියේ දී මුහුණ පාන ගැටලු විසඳා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට ගත හැකි වඩාත් ඵලදායී ක්‍රියාමාර්ගයක් වන්නේ,
(1) අපනයන විවිධාංගීකරණය දිරි ගැන්වීම යි.
(2) විදේශ ණය ආධාර සඳහා දිරි ගැන්වීම යි.
(3) බුද්ධිගලනය දිරි ගැන්වීම යි.
(4) ආනයනය දිරි ගැන්වීම යි.

17. ගැටුම් නිරාකරණය සඳහා යොදා ගනු ලබන මූලික ම ක්‍රමය වන සාකච්ඡා ක්‍රමයේ ගති ලක්ෂණයක් වන්නේ,
(1) වියදම අධික ම ක්‍රමයක් වීම ය.
(2) එක් පක්ෂයකට පමණක් ජය-ජය විසඳුම් ලැබීම ය.
(3) නීති මාලාවට අනුව විසඳුම් කරා යොමු වීම ය.
(4) අවිධිමත් ව්‍යුහයකින් යුක්ත වීම ය.

18. පුද්ගලයා තුළ, පුද්ගලයන් අතර , පවුල තුළ, පවුල් අතර ඇති වන ගැටුම් අයත් වන්නේ කුමන ගැටුම්වලට ද?
(1) සාර්ව (2) පවුල්
(3) සූක්ෂ්ම (4) පුද්ගල

19. යම් පුද්ගයෙකු වෙනත් පුද්ගලයෙකුගේ ජීවිතයට හෝ දේපළවලට හානි සිදු කළ විට ක්‍රියාත්මක වන නීතිය වන්නේ,
(1) සිවිල් නීතිය යි. (2) අපරාධ නීතිය යි.
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යි. (4) පරිසර නීතිය යි.

20. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය වන්නේ පහත ඒවායින් කුමක් ද?
(1) සිවිල් නීතිය
(2) රෝම ලන්දේසි නීතිය
(3) තේසවලාමේ නීතිය
(4) මුස්ලිම් නීතිය

21. ශ්‍රී ලංකාවේ පළාත්බද මහාධිකරණය සතු අධිකරණ බලය කුමක් ද?
(1) තෙස්තමේන්තු නඩු (2) රීති සැකසීමේ අධිකරණ බලය
(3) උපදේශන අධිකරණ බලය (4) වාණිජ ආරවුල් විසඳීම

22. අප්‍රමාද ව හා අපක්ෂපාතී ව යුක්තිය පසඳලීම සිදු නොවීම නිසා ඇති විය හැකි අවාසිදායක තත්වයක් වන්නේ,
(1) යුක්තිය ඉටු කර ගැනීම සඳහා විධිමත් ක්‍රම භාවිතයට යොමු වීම ය.
(2) රට තුළ සිදු වන අපරාධ හා දූෂණ අවම වීම ය.
(3) රට තුළ නීතියේ සමානාත්මතාව හා සාධාරණත්වය පිරිහීම ය.
(4) මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය ඉහළ යෑම ය.

23. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයෙන් සම්මත වූ පනත් කෙටුම්පතක් නීතියක් බවට පත් වීම සඳහා අත්සන් කළ යුතු පුද්ගලයා කවුද?
(1) ජනාධිපති (2) කථානායක
(3) අගවිනිසුරු (4) පාර්ලිමේන්තු මහ ලේකම්

24 1978 ව්‍යවස්ථාවේ දහතුන්වන සංශෝධනයෙන් පිහිටුවන ලද අධිකරණය කුමක් ද?
(1) පළාත්බද මහාධිකරණය (2) ශ්‍රේෂ්ඨාධිකරණය
(3) අභියාචනාධිකරණය (4) මහේස්ත්‍රාත් අධිකරණය

25. දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නවාංගය වන්නේ,
(1) නාමික විධායකය (2) නාමික ජනාධිපති ධුරය
(3) ඔම්බුඩ්ස්මන් ධුරය (4) විගණකාධිපති ධුරය

26 ශ්‍රී ලංකාවේ මහ මැතිවරණයක දී ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබන්නේ කුමක් ද?
(1) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය (2) පළාත
(3) නගර සභා බල ප්‍රදේශය (4) දිස්ත්‍රික්කය

27 ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලයක් **නොවන්නේ** කිනම් පිළිතුර ද?
(1) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
(2) ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
(3) ජනමත විචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය
(4) උපදේශන අධිකරණ බලය

28. දෙවන ජනරජ ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ඇතුළත් කර ඇති වගන්ති වන්නේ, .
(1) 10 සිට 12 තෙක් ය.
(2) 10 සිට 14 තෙක් ය.
(3) 10 සිට 16 තෙක් ය.
(4) 10 සිට 18 තෙක් ය.

29. "බාහිර බාධාකයන්ගෙන් තොර ව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්තාව නිදහසයි." මෙම ප්‍රකාශය ඉදිරිපත් කළේ,
(1) ගානර් ය. (2) ලැස්කි ය. (3) කෝල් ය. (4) රූසෝ ය.

30. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම විශේෂ අරමුණු හතරක් පදනම් කර ගෙන සිදු වේ. ඒවා නිවැරදි ව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) ආරක්ෂාව, පැවැත්ම, සංවර්ධනය, සහභාගිත්වය
(2) සෞඛ්‍යය, සංවර්ධනය, ආගම ඇදහීම, පැවැත්ම
(3) අධ්‍යාපනය, පැවැත්ම, සහභාගිත්වය, සෞඛ්‍යය
(4) ආරක්ෂාව, සංවර්ධනය, සෞඛ්‍යය, ආගම ඇදහීම

31. ජාත්‍යන්තර සබඳතා ගොඩනගා ගැනීමෙන් අත්වන ප්‍රතිඵලය කි,
(1) නව රැකියා අවස්ථා අහිමි වීම
(2) තාක්ෂණික දැනුම අහිමි වීම
(3) සංවර්ධන කටයුතු අඩාල වීම
(4) ජාත්‍යන්තරය තුළ හුදකලා නොවීම

32. සප්තා(SAPTA) හා සෆ්ටා (SAFTA) ගිවිසුම් ඇති කර ගන්නා ලද්දේ පහත සඳහන් කවර සංවිධානයක සාමාජික රටවල් අතර ද?
(1) ආසියාන් (2) සාර්ක් (3) බිම්ස්ටෙක් (4) ඔපෙක්

33. සංවර්ධිත රටවල් මෙන් ම සංවර්ධනය වෙමින් පවතින රටවල් ද පොදුවේ මුහුණ දෙන ගැටලුවකි,
(1) අවාසිදායක වෙළඳ ශේෂයක් පැවතීම.
(2) දේශපාලන අස්ථාවරත්වයක් පැවතීම.
(3) ජාත්‍යන්තර ත්‍රස්තවාදයේ බලපෑම.
(4) දේශීය සම්පත් හිමිකම විදේශිකයන් සතු වීම.

34. රාජ්‍යයන් අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යන ප්‍රධාන මාධ්‍ය වන්නේ,
(1) තානාපති සේවය යි. (2) යුනිසෙෆ් සංවිධානය යි.
(3) ජාත්‍යන්තර අධිකරණය යි. (4) යුරෝපා සංගමය යි.

35. ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණක් **නොවන්නේ,**
(1) තම රාජ්‍යයට තනිව සපුරා ගත නොහැකි දේ සපුරා ගැනීම ය.
(2) සමාජ ආර්ථික දේශපාලන ආදි ක්ෂේත්‍ර ඔස්සේ පටු සබඳතා ඇති කර ගැනීම ය.
(3) ප්‍රබල රාජ්‍යවලින් ඇති කරන විවිධ බලපෑම්වලින් ආරක්ෂා වීම ය.
(4) ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇතිවන බාධා මඟ හරවා ගැනීම ය.

36. තිරසර සංවර්ධනයේ දී වැදගත් වන 3R සංකල්පය යටතට **නොගැනෙන්නේ,**
(1) වැඩි කිරීම (2) අවම කිරීම
(3) නැවත භාවිතය (4) ප්‍රතිචක්‍රීකරණය

37. 19 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරිය හැකි වන්නේ,
(1) පාර්ලිමේන්තුව පත් වී අවම වශයෙන් වසරක කාලයක් අවසන් වූ පසුව ය.
(2) පාර්ලිමේන්තුව විසුරුවා හැරිය යුතු යැයි අගමැතිවරයා ඉල්ලා සිටි විටක ය.
(3) ජනාධිපතිවරයාට අභිමත පරිදි ඕනෑ ම අවස්ථාවක දී ය.
(4) පාර්ලිමේන්තුව පත් වී අවම වශයෙන් වසර හතරහමාරක කාලයක් ගත වූ පසුව ය.

38. 19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ශ්‍රී ලංකාවේ ජනාධිපතිගේ බලය සංවරණය කිරීම සඳහා නැවත ඇති කරන ලද ආයතනය වන්නේ,
(1) පාර්ලිමේන්තුව ය. (2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාධිකරණය ය.
(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ය. (4) ජාතික ප්‍රසම්පාදන කමිටුව ය.

39. පහත "අ" තිරුවේ සඳහන් ගැටුම් ඇති වන මුල සමඟ"ආ" තීරුවේ ඇති අංග නිවැරදිව ගළපන ලද පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| 1. වාර්ගිකත්වය | A නිකාය භේදය පදනම් කර ගත් අයර්ලන්ත යුද්ධය |
| 2. දේශපාලනය | B දරිද්‍රතාව පදනම් කර ගත් සෝමාලියාවේ අර්බුදය |
| 3. සමාජ ආර්ථික තත්වය | C කුලය පදනම් කර ගත් ටුට්සිවරු හා හුටුවරු අතර ගැටුම |
| 4. ආගමික මතවාද | D බල ව්‍යාප්තිය පදනම් කර ගත් යුක්‍රේනය හා රුසියාව අතර ගැටුම |

1. ACBD 2. ACDB 3. CDBA 4. DCBA

40. පහත සඳහන් වන්නේ වායු දූෂණය සිදුවන ක්‍රම කිහිපයකි.

A - ගුවන් යානා භාවිතය

B - දූවිලි කුණාටු

C - වනාන්තර විනාශ කිරීම

D - ළැව් ගිනි

E - කැලි කසළ

F - ගිනි කඳු පිපිරීම

ඉහත සඳහන් ක්‍රම අතුරින් කෘත්‍රිම ක්‍රම පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1.ACD 2.ACE 3.ADF 4.CDE

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 62 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II |
| **குடிமை கல்வி** | **I, II** |
| **Civic Education** | |

**පුරවැසි අධ්‍යාපනය II**

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. (i) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වූ ග්‍රීසියේ පෞර රාජ්‍යයන් **දෙකක්** නම් කරන්න.

   (ii) ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය පාලන ඒකකවලට බලය විමධ්‍යගත කිරීමට හේතු **දෙකක්** ලියන්න.

   (iii) යහපාලනයක මූලික ගුණාංග **දෙකක්** ලියන්න.

   (iv) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම **දෙක** ලියන්න.

   (v) ශ්‍රේෂ්ඨාධිකරණය සතු කාර්යයන් **දෙකක්** ලියන්න.

   (vi) ගෝලීයකරණයට මුහුණ දීමට රටවල් එකතු වී පිහිටුවා ගත් සංවිධාන **දෙකක්** නම් කරන්න.

   (vii) ගැටුම් නිරාකරණයේ දී බේරුම්කරුවකු සතු විය යුතු ගුණාංග **දෙකක්** සඳහන් කරන්න.

   (viii) නීතිපතිතුමාගේ කාර්යයන් **දෙකක්** සඳහන් කරන්න.

   (ix) පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ තිබෙන ආයතන **දෙකක්** නම් කරන්න.

   (x) ශ්‍රී ලංකාවට විදේශ ආධාර සපයන ආයතන **දෙකක්** නම් කරන්න.

   (ලකුණු 02 x 10=20)

2. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් යටතේ පාලන කටයුතු සිදු වන්නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවට අනුකූල ව ය.

   (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඇතුළත් විය යුතු ප්‍රධාන කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 02)

   (ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා ලැබෙන ප්‍රයෝජන **තුනක්** ලියන්න. (ලකුණු 03)

   (iii) (a) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක අංග ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

   (b) ඉන් **එක්** අංගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

3. රටක පාලනය නීතියේ උත්තරීතරභාවයට අනුව සිදු කිරීම නීතියේ ආධිපත්‍යය වේ.

(i) ජී. මාර්ෂල්ට අනුව නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(ii) අධිකරණයේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදන **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) අප්‍රමාද ව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම ප්‍රමාද වීම නිසා ඇති විය හැකි අවාසිදායක තත්ත්ව **තුනක්** ලියන්න. (ලකුණු 03)

(b) ඉහත කරුණු තුනෙන් **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

4. " සෑම ආකාරයක ම අධිකාරි බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශි වී තිබේ නම් එය ඒකීය රාජ්‍ය ක්‍රමයකි."

(i) නූතන ලෝකයේ පවතින ඒකීය රාජ්‍යයන් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) ඒකීය රාජ්‍යයක ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) සන්ධීය රාජ්‍යයන්හි නව ප්‍රවණතා **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(b) ඉහත කරුණුවලින් ඕනෑ ම **එකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

5. මූලික ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජයක් සංවිධානය වී ඇති ආකාරය 'අර්ථ ක්‍රමයක්' ලෙස හැඳින්විය හැකි ය.

(i) ධනවාදී අර්ථ ක්‍රමයක ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

(ii) මූලික ආර්ථික ප්‍රශ්න **තුන** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) (a) වර්තමානයේ ක්‍රියාත්මක වන නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයේ මූලික ලක්ෂණ **තුනක්** ලියන්න. (ලකුණු 03)

(b) ඉන් **එක්** ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

6. "ළමා කාලය තුළ හිමි විය යුතු අයිතිවාසිකම් මැනවින් භුක්ති විඳීමට අවස්ථාව නොලැබී යාම පරිපූර්ණ සංවර්ධනයට බාධාවකි."

(i) ළමා අයිතිවාසිකම් උල්ලංඝනය වන අවස්ථා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02)

(ii) ළමා අයිතිවාසිකම් සුරැකීමට ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** ලියන්න. (ලකුණු 03)

(iii) (a) මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(b) ඉන් **එක්** ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

7. "රාජ්‍යයන් අතර පවතින සහයෝගය මානව දියුණුවට අවශ්‍ය වේ."

(i) ජාත්‍යන්තර සබඳතා පවත්වන ප්‍රධාන ආකාර **දෙක** කුමක් ද? (ලකුණු 02)

(ii) ජාත්‍යන්තර සම්බන්ධතා වර්ධනය වීමෙහි ලා බලපෑ සාධක **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(iii) (a) ජාත්‍යන්තර වෙළඳාම තුළ භාවිත වන ප්‍රබල මුදල් ඒකක **තුනක්** ලියන්න. (ලකුණු 03)

(b) විදේශ වෙළඳාම හා සම්බන්ධ ජාත්‍යන්තර සංවිධාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)

*****